**කලවාන ප්‍රාදේශීය සභාව - 2020**

**-----------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**--------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**-------------------------------**

කලවාන ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට කලවාන ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**-----------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**-----------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

-----------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

-------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී ස්ථාවර වත්කම් වැඩිදියුණු කිරීම වෙනුවෙන් දරා තිබූ එකතුව රු. 1,146,520 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ස්ථාවර වත්කම් වැඩිදියුණු කිරීම වෙනුවෙන් දරා තිබූ වියදම ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කරන බව. | වත්කම් වැඩිදියුණු කිරීමේ පිරිවැය ප්‍රාග්ධනිත කළ යුතුය. |
| (ආ) | රු.5,688,251 ක් වූ මුද්දර ගාස්තු අධිවෙන්කිරීම සහ රු. 8,099,708 ක් වූ උසාවි දඩ ඌන වෙන්කිරීම් වෙනුවෙන් ගැලපීම් නොකිරීම හේතුවෙන් හා 2019 වර්ෂයේ වාර්තාව මඟින් පෙන්වා දී තිබූ ලැබිය යුතු මුද්දර ගාස්තු ඌන බිල්කිරීම් රු. 234,455 ක් වැඩියෙන් ගලපා තිබීම හේතුවෙන් අදාල ගිණුම් අඩුවෙන් හා වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරි වර්ෂයේ දී මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කරන බව. | මුද්දර ගාස්තු අධි වෙන්කිරීම් හා උසාවි දඩ ඌන වෙන්කිරීම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය . |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී කොරෝනා වසංගතය හේතුවෙන් අයකරගත නොහැකි ආදායම් එකතුව රු. 1,727,869 ක් සමුච්චිත අරමුදලට ගැලපීම හේතුවෙන් වර්ෂයේ මෙහෙයුම් ඌනතාවය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | සත්‍ය වශයෙන් ම අයකර ගත නොහැකි ආදායමක් ලෙස පෙන්නුම් කිරීම හේතුවෙන් සමුච්චිත අරමුදලට ගැලපීම සිදු කළ බව. | සමාලෝචිත වර්ෂය තුල අයකර ගත නොහැකි ආදායම සමුච්චිත අරමුදල තුලින් ගැලපීම නොකළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂය තුල කපාහැරීමට අනුමත කර තිබූ රු. 249,002 ක ණයහිමියන් සඳහා ගැලපීම් සිදුකර නොතිබුණි. | අතපසුවීමක් බවත් ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ දී නිවැරදි කරන බව. | වර්ෂය තුල කපාහරින ලද ණයහිමි වටිනාකම ගිණුම් ගත කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයට අදාල වැටුප් ප්‍රතිපූර්ණය බිල්කිරීම් රු. 267,486 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | පරීක්ෂා කර බලා ඉදිරි වර්ෂයේ දී ගිණුම් සකස් කිරීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වර්ෂයට අදාල බිල් කිරීම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා ආදියට යොමුව | අනුකූල නොවීම් | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132(ඹ) වගන්තිය | පුණ්‍ය හෝ සුභසාධන ආයතන වලට ආධාර කිරීමේදී එක් වර්ෂයකට මුළු එකතුව රු. 1,000 ඉක්මවන අවස්ථා වලදී අමාත්‍යවරයාගේ ලියවිල්ලකින් වූ පූර්ව අනුඥාව ලබාගත යුතු වුවද, එසේ කටයුතු කිරීමකින් තොරව 2020 වර්ෂය තුලදී බල ප්‍රදේශයේ පවතින සමිති සඳහා හියුම් පයිප්ප අවශ්‍යතාව සම්බන්ධයෙන් කාර්මික නිලධාරී වාර්තාවක් ලබා ගැනීමෙන් තොරව හියුම් පයිප්ප බෙදාහරින ලද අවස්ථා නිරීක්ෂණය වූ අතර, ඒ සඳහා වර්ෂය තුල වැය විෂයයන් 03 ක් යටතේ එකතුව රු. 2,698,200 ක මුදලක් වැයකර තිබුණි. | ඉදිරියේදී සිදු කරන මිලදී ගැනීම් සඳහා අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු. 5,797,765 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු. 38,918,876 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **වරිපනම් හා බදු** | | |
| (i) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු.2,187,279 ක් වූ හිඟ වරිපනම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර, වරිපනම් බදු හා අක්කර බදු වටිනාකම් මූල්‍ය ප්‍රකාශන අනුව හා අනුරූපී වාර්තා | දේපළ තහනම් කිරීමේ වැඩසටහන් පැවැත්වීමට සැලසුම් කල ද කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් එම වැඩසටහන් ක්‍රියාත්මක නොකරන ලද නමුත් මෙම වරිපනම් බදු හිමියන් | සභාව වෙත අයවිය යුතු ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. එමෙන්ම ලෙජර් ගිණුම් හා |

| | | | |
|---|---|---|---|
| | අනුව පිළිවෙලින් රු. 11,182,195 ක් හා රු. 417,021 ක වෙනසක් නිරීක්ෂණය විය. | වෙත ලිඛිතව දැනුම් දීමෙන් සහ ශබ්ද විකාශන යන්ත්‍ර මඟින් දැනුවත් කිරීම සිදුකල බවත් ගිණුම් ශේෂ පරීක්ෂා කර බලා නිවැරදි කරන බව. | උපයෝගී ලේඛන සැසඳිය යුතුය. |
| (ii) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු. 226,164 ක් වූ හිඟ අක්කර බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ආදායම් අය කර ගැනීමේ කටයුතු සිදු කරමින් පවතින බව. | සභාව වෙත අයවිය යුතු ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| **(ආ)** | **කුලී**<br>**-----** | | |
| (i) | අවශ්‍ය පහසුකම් ලබා නොදීම හේතුවෙන් නව බස් නැවතුම්පල කඩකාමර 20 ක් බදු ගිවිසුම් මඟින් පවරා දීමට කටයුතු කර නොතිබුණි. නව බස් නැවතුම්පල කඩකාමර 20 ට අදාල රු. 808,500 ක් වූ ඇස්තමේන්තුගත ආදායම 2020 අයවැයෙහි 5/22 (කඩකුලී) ශීර්ෂය යටතේ දක්වා තිබූ බව වැඩිදුරටත් නිරීක්ෂණය විය. | මෙම කඩකාමර සඳහා විදුලි පහසුකම් ලබා දී පවරා දී, කඩ කුලී ගාස්තු ඉදිරියේ දී අය කර ගැනීමට කටයුතු කරන බව. | බදු දේපල බදු ගිවිසුමකින් පවරා දී ලැබිය යුතු කුලී ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) | අමාත්‍යවරයාගේ අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂයට අදාලව ලැබිය යුතු කඩකුලී, සතිපොල, මස්කඩ, මාළුකඩ කුලී එකතුව රු. 1,727,869 ක් කොරෝනා වසංගතය හේතුවෙන් කපාහැර තිබුණි. | අයකර ගත නොහැකි ගාස්තු කපා හරින ලද බව හා එම තීරණය ආණ්ඩුකාර අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇති බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව අමාත්‍යවරයාගේ අනුමැතියට යටත්ව කපාහැරීම් සිදු කළ යුතුය. |
| **(ඇ)** | **වෙනත් ආදායම්**<br>**-----------------** | | |
| | 2020 ජනවාරි පැවැත්වූ දැන්වීම් පුවරු සමීක්ෂණය මඟින් හඳුනාගත් ස්ථිර දැන්වීම් පුවරු 04 ක් වෙනුවෙන් අයවිය යුතු රු. 86,750 ක මුදල අයකර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි. | ආයතනවලින් අය විය යුතු මුදල් කඩිනමින් අය කර ගැනීමට කටයුතු කරන බව. | සභාව වෙත අයවිය යුතු ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**-----------------------------**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

## 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (ආ) | රද්දැල්ල, වැලිකුඹුර පාරේ 5/1 දරන පාලම ඉදිකිරීම සඳහා ප්‍රාදේශීය සභාව සමඟ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය 2013 වර්ෂයේදී එකඟ වී එම ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවේ මූල්‍ය හා කොන්ත්‍රාත් පරිපාලන කටයුතු සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මැදිහත්ව කටයුතු කර තිබුණි. ඒ අනුව කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගැනීම සහ කොන්ත්‍රාත්කරුවෙකු සමඟ ගිවිසුම් ගතවීම ප්‍රාදේශීය සභාව විසින් සිදුකර තිබුණි. නමුත් කොන්ත්‍රාත්තුවේ ගැටළුසහගත තත්ත්වයකදී කටයුතු කලයුතු ආකාරය සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාව ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය සමඟ එකඟතාවයකට පැමිණ නොතිබුණු අතර, ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවේ මූල්‍ය හා පරිපාලන කටයුතු සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මැදිහත් වන බව කොන්ත්‍රාත්කරු සමඟ එළඹි ගිවිසුමේ සඳහන් කර නොතිබුණි. කොන්ත්‍රාත්තුවට ගෙවීම් කිරීමේදී ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ඉංජිනේරුවරයාගේ නිර්දේශය මත කොන්ත්‍රාත්කරුට නොගෙවූ රු. 5,654,599 ක්ද, 2014 ජූනි 14 දින සිට ඊට අදාල පොළියද බේරුම්කරණ ගාස්තුද ඉල්ලමින් කොන්ත්‍රාත්කරු විසින් සභාවට එරෙහිව බේරුම්කරණ කටයුත්තකට එළඹ තිබුණි.<br>සමාලෝචිත වර්ෂය අවසාන වනවිට සභා අරමුදලින් නීති ගාස්තු සඳහා රු. 555,394 ක මුදලක් ද වැයකර තිබුණු අතර, ඉදිරියේදී ප්‍රාදේශීය සභාව අසම්භාව්‍ය වගකීමකටද ලක්ව තිබුණි. | මෙම ව්‍යාපෘති පසුගාමී පළාත් පලාන ආයතන තෝරා ඒවා නගා සිටුවීමේ අරමුණින් දිවයින පුරා එකම ක්‍රමවේදයක් අනුව ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතියක් වන හෙයින් ගැටළු සහගත අවස්ථාවකදී කටයුතු කළ යුතුආකාරය සම්බන්ධව එකඟතාවයකට එළඹීමට සභාව වෙත හැකියාවක් නොමැති බව. | ගිවිසුම් ගත වීමේදී කොන්ත්‍රාත්තුවට අදාල සියලු කරුණු අන්තර්ගත වන පරිදි එකඟතාවට පැමිණිය යුතුය. |
| (ඇ) | පනාපොල අඹගහකන්ද පැන්ටැක් ජල විදුලි බලාගාරය මෙගා වොට් 2.4 ක ධාරිතාවයකින් ඉදිකිරීම සඳහා අනුමැතිය ලබා දී තිබුණද, අදාල ක්‍රියාත්මක සමාගම මෙගා වොට් 4.2 ක ධාරිතාවකින් විදුලි උත්පාදනය කරන බව ලංකා විදුලි බල මණ්ඩලය මඟින් ද තහවුරු කර තිබුණි. මෙම ව්‍යාපෘතිය හරහා පරිසරයට සිදුවන හානිය සම්බන්ධයෙන් ප්‍රදේශවාසීන් හා සිංහරාජ සුමිතුරෝ සංවිධානය මඟින් සභාව දැනුවත් | බලාගාරය සඳහා ලබා දී තිබූ ඉදිකිරීම් අනුමැතිය අවලංගු කරන බවටත් මෙම බලාගාරයේ කටයුතු වහාම නතර කරන ලෙසටත් එසේ නොකරන්නේ නම් නීතිමය ක්‍රියාමාර්ග ගන්නා බව. | ධාරිතාව ඉක්මවා ක්‍රියාකිරීම සම්බන්ධයෙන් සමාගමට එරෙහිව පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කලද, ධාරිතා ඉක්මවා ක්‍රියාකිරීම හා එමඟින් සිදුවන පරිසර හානිය සම්බන්ධයෙන් සොයාබලා ඒ අනුව ක්‍රියාකිරීමට සභාව අපොහොසත් වී තිබුණි. | | |
| (ඇ) | කොස්ගුලන කුඩා පරිමාණ ජල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා 2018 සැප්තැම්බර් 07 දිනැති මහා සභා රැස්වීමේදී අනුමැතිය ලබා දී තිබුණද, එමඟින් විශාල වශයෙන් පරිසර හානි සිදුවීම නිසා ව්‍යාපෘතියේ කටයුතු වහාම අත්හිටුවන ලෙස සභාව මඟින් දන්වා තිබුණු නමුත් 2021 පෙබරවාරි වනවිටත් අදාල බලාගාරයේ කටයුතු අත්හිටුවීමට කටයුතු කර නොතිබුණි. | ලිපියක් මඟින් දැනුවත් කර තවදුරටත් සොයා බලා මෙම ව්‍යාපෘතියේ කටයුතු අත්හිටුවීමට කඩිනමින් පියවර ගන්නා බව. | සිදුවන පරිසර හානිය පිළිබඳ තක්සේරුවක් සිදු කර බලාගාරයේ කටයුතු අත්හිටුවීමට කටයුතු කළ යුතුය. |

**3.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභා අරමුදල් යොදවා කලවාන පොළ භූමිය සංවර්ධනය කිරීම කර්මාන්තය ඉටු කිරීම සඳහා කලවාන බටහිර ගොවි සංවිධානය සමඟ රු.524,128 ක් වටිනාකමැති ගිවිසුමකට 2020 ඔක්තෝබර් 15 දින එළඹ තිබුණු අතර, ඇස්තමේන්තුවේ විෂයය අංක 02 සහ 04 යටතේ ඉටුකර තිබූ වැඩ යාන්ත්‍රිකව සිදුකර තිබුණද, ඒ සඳහා ශ්‍රමය භාවිතයෙන් ඉටුකිරීමේ රේටයන් යොදා ගැනීම හේතුවෙන් පිළිවෙලින් රු. 101,597 ක් හා රු. 49,143 ක් වැඩිපුර ගෙවා තිබුණි. එමෙන්ම කර්මාන්තය සඳහා භාවිතා කර තිබූ පස් සහ ABC ප්‍රමාණය ගෙවීම් කල ප්‍රමාණයට වඩා අඩුවීමෙන් ඒ සඳහා පිළිවෙලින් රු. 50,420 ක් සහ රු. 5,538 ක් වශයෙන් එකතුව රු. 206,698 ක් වැඩිපුර ගෙවා තිබුණි. | පස් කැපීම සිදුකරන ස්ථානයේ නිවසක් පිහිටා ඇති නිසා කම්කරුවන් යෙදීමට සිදු වූ බවත් යන්ත්‍රයක් යොදාගෙන ඇත්තේ පස් පැටවීම සඳහා පමණක් බවත් එබැවින් EW 1 - 001 මිල ගණන් යොදා ගැනීමට සිදු වූ බව හා කුඩා ප්‍රමාණයේ ABC යොදා ගැනීමේ දී කර්මාන්ත සඳහා MI-013M මිල ගණන් යොදා ගන්නා බවත් ABC ප්‍රවාහනය දුර කි.මී. 53 සිට කරන බැවින් කි.මී. 30 ක් සඳහා පමණක් ගෙවීම් සිදු කරන බව. | ඇස්තමේන්තු සැකසීමේදී වඩා සුදුසු පිරිමැසුම්දායක රේටය යොදාගත යුතුය. |
| (ආ) | සාවද්‍ය රේටයන් පදනම් කරගෙන ගෙවීම් කිරීම. | | |
| (i) | පළාත් සභා අරමුදල් මත ඉටුකල තපස්සර කන්ද ක්‍රීඩාපිටිය සංවර්ධනය කිරීමේදී කපන ලද පස් ප්‍රමාණය අනුව ප්‍රායෝගික හා රජයට පිරිමැසුම්දායක රේටය වූ මැෂින් භාවිතයෙන් පස් කැපීමේ රේටය | පස් කැපීම සිදු කරන ස්ථානයේ නිවසක් පිහිටා ඇති නිසා කම්කරුවන් යෙදීමට ද සිදු විය එබැවින් $EW_1$ - 001 මිලගණන් යොදා ගැනීමට සිදු වූ බව. | ඇස්තමේන්තු සැකසීමේදී වඩා සුදුසු පිරිමැසුම්දායක රේටය යොදාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වෙනුවට ශ්‍රමය භාවිතයෙන් පස් කැපීම සඳහා වූ රේටය මත ගෙවීම් කිරීම හේතුවෙන් රු. 429,468 ක් වැඩිපුර ගෙවා තිබුණි. | | |
| (ii) | සභා අරමුදල් මඟින් නිම කරනු ලැබූ කර්මාන්ත 03 ක් වෙනුවෙන් මාර්ග ඉදිකිරීම් ගාස්තු ලේඛනය (2020) අනුව ABC ඇතිරීමේදී යොදාගත යුතු රේටය M1-012A වුවත්, ඒ සඳහා M1-013 (පළල මීටර් 1.2 ට වඩා අඩු ස්ථාන සඳහා ABC යෙදීමට භාවිතා කරන) රේටය යොදා ගැනීම හේතුවෙන් එකතුව රු. 144,356 ක් වැඩිපුර ගෙවා තිබුණි. | $M_1$ .012 A මිල ගණන් භාවිතා කරනුයේ විශාල ඉදිකිරීම් සඳහා බවත් මෙම කර්මාන්ත සඳහා ABC ඇතිරීම මීටර් 1.20 ට වඩා අඩු ලේයර්ස් වශයෙන් ABC යොදා තැලීම සිදු කර ඇති අතර මෝටර් ග්‍රේඩර් භාවිතා කර නැති බවත් එබැවින් $M_1$ .013 මිළ ගණන් යටතේ ABC ඇතිරීම සිදු කරන බව. | ඇස්තමේන්තු සැකසීමේදී වඩා සුදුසු පිරිමැසුම්දායක රේටය යොදාගත යුතුය. |
| (iii) | පළාත් සභා අරමුදල් හා සභා අරමුදල් මඟින් ඉදිකරනු ලැබූ මාර්ග 07 ක කොන්ක්‍රීට් යෙදීම සඳහා හැඩයම් ගැසීම වෙනුවෙන් වඩාත් සුදුසු, ප්‍රායෝගික සහ රජයට පිරිමැසුම්දායී රේටය වශයෙන් ST1-057 වෙනුවට ST1-064 හා ST1-065 යොදා ගැනීම හේතුවෙන් රු. 105,635 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. | මාර්ග කොන්ක්‍රීට් කිරීමේ දී ඉතා හොඳ ලෑලි යොදාගත යුතු බවත් ඒ සඳහා ST1-064/065 මිළ ගණන් යොදාගත යුතු බවත් කොන්ක්‍රීට් තුළට ජලය කාන්දු වීම නිසා කල්ගත වීමේ දී කොන්ක්‍රීට්වල ශක්තිය අඩු වීම, කැඩී යාම ආදිය සිදු විය හැකි නිසා කොන්ක්‍රීට් දෙපස සුමට ආකාරයට පැවතිය යුතු බව. | ඇස්තමේන්තු සැකසීමේදී වඩා සුදුසු පිරිමැසුම්දායක රේටය යොදාගත යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 පාරිසරික ගැටළු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභා බල ප්‍රදේශය තුල සමාලෝචිත වර්ෂයේ ඝන අපද්‍රව්‍ය මෙට්‍රික් ටොන් 1440 ක් පමණ බැහැර කිරීම සඳහා රු. 358,000 ක පිරිවැයක් හා කාර්යය මණ්ඩල සේවකයින් 07 දෙනෙකු ද වාහන 03 ක් ද යොදවා තිබුණි. එසේ වුවද, එම අපද්‍රව්‍ය බැහැර කිරීම විධිමත් හා පරිසර හිතකාමී ක්‍රමවේදයකින් බැහැරව භූමියේ වලවල් හාරා ඒ තුළ අපද්‍රව්‍ය බැහැර කර වලවල් වසා දමා තිබුණි. | විධිමත්ව කසළ බැහැර කිරීම සඳහා කසළ අංගනයක් ඉදිකිරීමට නිරවුල් ඉඩමක් නොමැති අතර ඉඩමක් ලබා ගැනීම වෙනුවෙන් කටයුතු සිදු කරන බව. | විධිමත් කසළ කළමනාකරණ සැලැස්මක් සකස් කර අනුගමනය කළ යුතුය. |